දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2014 පරීක්ෂණය - 2017 ඔක්තෝබර්
Bachelor of Arts General (External) Degree Part II 2014 Examination – October 2017

# දේවිසා 3.1 - තුලනාත්මක දේශපාලනය
# PSG 3.1 - Comparative Politics

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත්අකුරින් පිළිතුරු ලිවිය යුතුය

---

01. "තුලනාත්මක දේශපාලනය" නිර්වචනය කොට "තුලනාත්මක දේශපාලන විද්‍යාව" විෂයක් ලෙස වර්ධනය වූ ආකාරය විභාග කරන්න.

02. තුලනාත්මක දේශපාලන විද්‍යා අධ්‍යයනයේ සාම්ප්‍රදායික ප්‍රවේශය (Traditional Approach) හි තිබූ අඩු පාඩු හා සීමාවන් ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද?

03. "චර්යාවාදී විශ්ලේෂණ ක්‍රමය (Behavioral Approach) දේශපාලන විද්‍යා අධ්‍යයනය නව මාවතකට ප්‍රවේශ කරන ලදී." විමසන්න.

04. "ප්‍රජාතන්ත්‍රවාදය" නැමති පාලන සම්ප්‍රදාය නූතන ආණ්ඩු ක්‍රමයන්හි විවිධ ස්වරූපයන්ගෙන් භාවිත වේ. විමසන්න.

05. "නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන් තුළ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂවල කාර්යභාරය සම්ප්‍රදායික කාර්යභාරයන්ගෙන් පමණක් විස්තර කිරීම බෙහෙවින් අසීරු වේ." අදහස් දක්වන්න.

06. "කිසියම් සංවිධිත හා සංවරණය කරන ලද පාලන ව්‍යුහයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය මගින් ප්‍රකාශ වේ." සාකච්ඡා කරන්න.

07. දේශපාලන සමාජානුයෝජනය (Political Socialization) යන්න පැහැදිලි කොට, එහි කාරක සාධක දක්වන්න.

08. "කිසියම් රටක දේශපාලන සංස්කෘතිය (Political Culture) හැදෑරීම එම රටේ දේශපාලන භාවිතය හඳුනාගැනීමට ඉවහල් වේ." සාකච්ඡා කරන්න.

09. දේශපාලන ක්‍රම විශ්ලේෂණයේ (Political System Theory) ග්‍රේබියෙල් ඒ ආමන්ඩ් (Grabrial A. Almond) ගේ සත්විද කාර්ය විශ්ලේෂණ ක්‍රමය (Seven Functions Analysis System) පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

    I. දේශපාලන සංවර්ධනය (Political Development)
    II. තුලනාත්මක දේශපාලනය හා ඇරිස්ටෝටල්
    III. සංධිය ආණ්ඩුක්‍රමය
    IV. දේශපාලන සහභාගිත්වය (Political Praticipation)